# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

## වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

# ඇබෑර්තු

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පවතින පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 1. අධ්‍යක්ෂ ජනරාල් තනතුර (HM2-1) - (තනතුරු 01)

**රැකියා විස්තරය :**

අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා වේ. අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් සඳහා වගකිව යුතු හා වගකීමෙන් බැඳී සිටින අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ මගපෙන්වීම හා පාලනය යටතේ ආයතනයේ මූල්‍ය කටයුතු හා පරිපාලන කටයුතු මෙහෙයවීම හා ක්‍රියාවට නැංවීම සිදු කළ යුතුයි. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරනු ලබන කාර්යයන් ඉටුකිරීම, බලතල ක්‍රියාවට නැංවීම හා ඉටුකිරීම, නිල කාර්යය සාධනයන් විශිෂ්ඨත්වයට පත්කිරීමේ දී හා නව තාක්ෂණ ක්‍රමවේදයන් කරා ප්‍රවේශ වීමේදී ආයතනයේ කාර්යය මණ්ඩලය වෙත අවශ්‍ය දිරිගැන්වීම හා නායකත්වය ලබාදිය යුතු වේ.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලන, ව්‍යාපාර කළමනාකරණ, රාජ්‍ය පරිපාලන, රාජ්‍ය කළමනාකරණ, ආර්ථික විද්‍යාව, වාණිජ්‍ය, විද්‍යාව (ආහාර විද්‍යාව හා තාක්ෂණය, ජීව විද්‍යාව), කෘෂිකර්මය, නීතිය යන ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය කළමනාකරණ ආයතනයක, ආයතනික සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවු. 18 ක පළපුරුද්දක් ලබා තිබීම හා එයින් අවුරුදු 05 ක් සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක සනාථ කළ කාර්යය සාධනයක් සමග පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලන, ව්‍යාපාර කළමනාකරණ, රාජ්‍ය පරිපාලන, රාජ්‍ය කළමනාකරණ, ආර්ථික විද්‍යාව, වාණිජ්‍ය, විද්‍යාව (ආහාර විද්‍යාව හා තාක්ෂණය, ජීව විද්‍යාව) කෘෂිකර්මය, නීතිය යන ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (PhD) ලබා තිබීම.

**සහ**

ආචාර්ය උපාධිය (PhD) ලබාගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක සනාථ කළ කාර්යය සාධනයක් සමග අවම වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සහ**

බහු විෂය ක්ෂේත්‍ර කණ්ඩායම් හට නායකත්වය ලබාදීම සහ මෙහෙයවීම පිළිබඳ සනාථ කළ නිපුණතාවයකින් යුක්ත වීම.

මානව හා වෙනත් සම්පත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ හා නිසි ලෙස යෙදවීමේ පළපුරුද්ද.

**වැටුප් පරිමාණය :**

HM2-1:2025 රු. (161,140 - 12X4,850 -219,340) (2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**වැටුප :** රු. 119,494/= (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (DMS) චක්‍රලේඛ අංක 1/2025 ප්‍රකාරව - 2025.01.01 දිනට මූලික වැටුප)

**ප්‍රවාහන සහ ඉන්ධන දීමනාව :**

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේතුවේ (PED) චක්‍රලේඛ අංක 01/2015, 01/2015 (i) සහ (ii) හි නියමයන් ප්‍රකාරව නිල වාහනයක් භාවිතා කිරීමට හෝ මාසික ප්‍රවාහන දීමනාවක් සහ ඉන්ධන දීමනාවක් ලබාගැනීමට හිමිකම ඇත.

**වෘත්තීය දීමනාව :**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (DMS) චක්‍රලේඛ අංක 01/2015 හි නියමයන් ප්‍රකාරව වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ.

**වෙනත් දීමනා :**

වැටුපට අතිරේකව, ජීවන වියදම් දීමනාව සහ අදාළ රාජ්‍ය චක්‍රලේඛ ප්‍රකාරව වෙනත් අදාළ දීමනාවන්ද ගෙවනු ලැබේ.

**වයස :** වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

### 2. අධ්‍යක්ෂ තනතුර - නීති සහ බලගැන්වීම් (HM 1-1) (තනතුරු - 01)

**රැකියා විස්තරය :**

ඕනෑම අධිකරණයක්, විනිශ්චය සභාවක් හෝ අධිකාරියක් ඉදිරියේ අධිකාරිය නියෝජනය කිරීම, අධිකාරිය වෙනුවෙන් නඩු පැවරීමේ දැන්වීම් ලබාගැනීම සහ අවශ්‍ය අවස්ථාවන් හිදී අධිකාරිය වෙනුවෙන් පෙනී සිටීම සහ නියෝජනය කිරීම. පාරිභෝගික අධිකාරිය පනත යටතේ කරන ලද නියෝගයකට අනුකූල වීම, නිෂ්පාදකයින් සහ වෙළඳුන් අපොහොසත් වන විට පනත මගින් නියමකර ඇති පරිදි අධිකාරියේ අනුකූලතා සහ බලාත්මක කිරීමේ කාර්යය ඉටු කිරීම, එවැනි නඩු විභාග කිරීම සහ පනත මගින් නියම කර ඇති පරිදි ඒ අනුව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම, අවශ්‍යය විටෙක නීතිපති දෙපාර්තමේන්තුව, අනෙකුත් නීති උපදේශකයින් සහ අදාළ ආයතන සමග සම්බන්ධ වී කටයුතු කිරීම, පනතේ නියමයන් ප්‍රකාරව, අධිකාරිය විසින් ඕනෑම නිෂ්පාදකයකු හෝ වෙළෙන්දෙකු හෝ නිෂ්පාදකයින්ගේ හෝ වෙළඳුන්ගේ සංගමයක් සමග එළඹ ඇති ගිවිසුම් සකස් කිරීම සහ බලාත්මක කිරීම සඳහා වගකිව යුතු අතර, අධිකාරිය විසින් නිකුත් කරන ලද සියලුම නියෝග සහ අධිකාරිය විසින් ස්ථාපිත කරන ලද අනෙකුත් නීතිමය ක්‍රියාමාර්ගයන්ට අදාළ වාර්තා පවත්වාගෙන යාම, පාරිභෝගික පැමිණිලි ඒකකයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, අධිකාරිය විසින් නිකුත් කිරීමට නියමිත ගැසට් නිවේදන සකස් කිරීම, අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල විසින් හසුරුවනු ලබන නීතිමය කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම, පනතේ කාර්යය පිළිබඳව කාර්යය මණ්ඩලයට පැහැදිලි කිරීම සහ උපදෙස් දීම සහ නියෝග සහ / හෝ රෙගුලාසි මගින් එහි දක්වා ඇති මාර්ගෝපදේශ අර්ථ නිරූපණය කිරීම, අධිකාරියේ අනෙකුත් සියලුම අංශ වෙත සහය සේවා සැපයීම, පාරිභෝගික සේවා කවුන්සිලය වෙත සහය සේවා සැපයීම, පාරිභෝගික ආරක්ෂාව සහ තරගකාරී විරෝධී පිළිවෙත් සම්බන්ධයෙන් ජාත්‍යන්තර ක්ෂේත්‍රයේ නීතිමය සංවර්ධනය පිළිබඳව දැනුම්වත් වීම, පහත කටයුතු සම්බන්ධයෙන් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ සාමාජිකයන්ට සහය ලබාදීම.

- i. නඩු පැවරීමට අදාළ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් ඉල්ලා සිටින පැහැදිලි කිරීම්
- ii. අර්ථ නිරූපනය කිරීම්
- iii. නියාමකයෙකු ලෙස ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී අදහස / මතය ප්‍රකාශ විධිමත්ව ක්‍රමවත්ව දැක්වීම.
- iv. කාර්යය මණ්ඩලය, කම්කරු සුභසාධන වන්දි හෝ විනය සම්බන්ධ වෙනත් ඕනෑම කටයුත්තක්.
- v. අධිකාරිය එහි කාර්යයන් සහ අභිලාෂයන් සම්බන්ධයෙන් සෘජුවම සම්බන්ධ වන වෙනත් ඕනෑම සහ තවත් ගැටලු.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

නීතිඥ සහ පශ්චාත් උපාධි සුදුසුකම (Masters) සමග දිවුරුම් දීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ වෙළඳ ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 15 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

තනතුරට අදාළ විෂය කේෂ්ත්‍රයේ කළමනාකරණ කාණ්ඩයේ I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය :** HM 1-1:2025 රු. (140,640 - 15X4,100 -202,140) (2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**වැටුප :** රු. 105,399/= (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (DMS) චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව 2025.01.01 දිනට මූලික වැටුප)

**ප්‍රවාහන සහ ඉන්ධන දීමනාව :**

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ (PED) චක්‍රලේඛ අංක 01/2015, 01/2015 (i) සහ (ii) හි නියමයන් ප්‍රකාරව නිල වාහනයක් භාවිත කිරීමට හෝ මාසික ප්‍රවාහන සහ ඉන්ධන දීමනාවක් ලබාගැනීමට හිමිකම ඇත.

**වෘත්තීය දීමනාව :**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (DMS) චක්‍රලේඛ අංක 01/2025 හි නියමයන් ප්‍රකාරව වෘත්තීය දීමනාක් ගෙවනු ලැබේ.

**වෙනත් දීමනා :**

වැටුපට අතිරේකව, ජීවන වියදම් දීමනාව සහ අදාළ රාජ්‍ය චක්‍රලේඛ ප්‍රකාරව වෙනත් අදාළ දීමනාවන්ද ගෙවනු ලැබේ.

වයස : වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

### 3. දත්ත සම්බන්ධීකාරක තනතුර (MA 5-2) - (තනතුරු -01)

**රැකියා විස්තරය :**

දත්ත ඇතුළත් කිරීම, දත්ත සමූහය නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම, යෙදුම් මෘදුකාංග භාවිතයෙන් දත්ත වගුගත කිරීම සහ වාර්තා ලබාගැනීම, වෙබ් අඩවි යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම, අධක්ෂවරයා විසින් පවරනු ලබන වෙන්ත ඕනෑම රාජකාරී ඉටුකිරීම.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණය/ තොරතුරු පද්ධති හෝ පරිගණක පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**අතිරේක සුදුසුකම් :**

අදාළ ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබාතිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**වැටුප් පරිමාණය :** MA5-2 : 2025 රු. (62,310 - 10X1,360-15 X1,670 -5X2,040 - 111,160) (2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**වැටුප :** රු. 51,488/= (කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ (DMS) චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව 2025.01.01 දිනට මූලික වැටුප)

**වයස :** වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

### 4. පරිපාලන නිලධාරී තනතුර (MA 5-2) - (තනතුරු 01)

**රැකියා විස්තරය :**

භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා සහයවීම, සේවකයින් බඳවා ගැනීම සඳහා සහය වීම, උපයෝගිතා බිල්පත් සකස් කිරීම, වැටුප් තොරතුරු විශ්‍රාම ප්‍රතිලාභ පිළිබඳ උපලේඛන පැමිණීමේ සහ නිවාඩු වාර්තා, ප්‍රවාහන පාලනයට අදාළ වාර්තා පවත්වාගෙන යාම, පරිශ්‍රයේ පිරිසිදුකම පවත්වා ගැනීම සහ සෞඛ්‍ය හා ආරක්ෂක පියවරයන් අනුගමනය කිරීම EPF/ETF, පාරිතෝෂිත ගෙවීම් සහ අනෙකුත් විශ්‍රාම ප්‍රතිලාභ අදාළ ආයතනය සමග සම්බන්ධීකරණය කිරීම, සේවකයින් සඳහා ණය වැටුප් සහ අනෙකුත් අත්තිකාරම් සැකසීම, සේවා සපයන්නන් සමග ඇති සියලුම ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට සහය වීම, තැපැල් කටයුතු මෙහෙයවීම, මානව සම්පත් කළමනාකරණ පද්ධති නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම, සේවකයින්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමට සහ පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරීමට සහය වීම, සේවකයින් සහභාගි වන පුහුණු වැඩසටහන්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම, සියලුම අභ්‍යන්තර විභාග පැවැත්වීමට සහයවීම, සේවකයින්ගේ කාලානුරූප කාර්යය සාධන ඇගයීමට සහය වීම, අධක්ෂකවරයා විසින් පවරන වෙනත් ඕනෑම රාජකාරී ඉටුකිරීම.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**අතිරේක සුදුසුකම් :**

අදාළ ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබාතිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**වැටුප් පරිමාණය :** MA5-2 : 2025 රු. (62,310 - 10X1,360-15 X1,670 -5X2,040 - 111,160) (2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**වැටුප :** රු. 51,488/= (කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ (DMS) චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව 2025.01.01 දිනට මූලික වැටුප)

**වයස :** වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

### 5. ගිණුම් නිලධාරී තනතුර (MA 5-2) - (තනතුරු 03)

**රැකියා විස්තරය :**

වත්කම් සංචලනය ලේඛන පවත්වාගෙන යාම, ලදුපත් සහ ගෙවීම් සත්‍යාපනය කිරීම, වැටුප් ලේඛන සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් පරීක්ෂා කිරීම, මුදල් පොත පාලනය කිරීම, මාසික ගිණුම් සකස් කිරීමට සහය වීම, මාසික මුදල් පුරෝකථනය සකස් කිරීමට සහය වීම, චෙක්පත් සකස් කිරීම, අධ්‍යක්ෂවරයා විසින් පවරන වෙනත් ඕනෑම රාජකාරී ඉටුකිරීම.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගිණුම්කරණය, වාණිජ්‍ය හෝ කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම. හෝ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) ලබා තිබීම.

**හෝ**

CIMA, ICASL, ACCA, CMA හෝ වෙනත් ඕනෑම වෘත්තීය ගිණුම්කරණ ආයතනයක අන්තර්මධ්‍ය මට්ටම සම්පූර්ණ කර තිබීම.

**අතිරේක සුදුසුකම් :**

අදාළ ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**වැටුප් පරිමාණය :** MA5-2 : 2025 රු. (62,310 - 10X1,360-15 X1,670 -5X2,040 - 111,160) (2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**වැටුප :** රු. 51,488/= (කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ (DMS) චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව 2025.01.01 දිනට මූලික වැටුප)

**වයස :** වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

### 6. පිරිවැයකරන නිලධාරී තනතුර (MA 5-2) - (තනතුරු 02)

**රැකියා විස්තරය :**

නිෂ්පාදනවල පිරිවැයකරණය සඳහා සහය වීම විශේෂිත භාණ්ඩ සහ සඳහා සේවාවන්හි මිල නියාමනය කිරීම සඳහා සහය වීම, දත්ත එක් රැස්කිරීම සහ දත්ත සංචිත පවත්වාගෙන යාම, අධීක්ෂණය කිරීම, වෙළඳ භාණ්ඩවල ජාත්‍යන්තර වෙළඳ පොළ මිල විචලනයන් පිළිබඳ අධ්‍යනය කිරීම සහ වාර්තා කිරීම, කාර්යක්ෂමතාවය පිළිබඳ අධ්‍යයනය පැවැත්වීමට සහය වීම සහ අධ්‍යක්ෂවරයා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරී ඉටුකිරීම.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගිණුම්කරණය, වාණිජ්‍ය හෝ කළමනාකණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**හෝ**

CIMA, ICASL, ACCA, CMA හෝ වෙනත් ඕනෑම වෘත්තීය ගිණුම්කරණ ආයතනයක අන්තර්මධ්‍ය මට්ටම සම්පූර්ණ කර තිබීම.

**අතිරේක සුදුසුකම් :**

අදාළ ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**වැටුප් පරිමාණය :** MA5-2 : 2025 රු. (62,310 - 10X1,360-15 X1,670 -5X2,040 - 111,160) (2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**වැටුප :** රු. 51,488/= (කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ (DMS) චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව 2025.01.01 දිනට මූලික වැටුප)

**වයස :** වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

### 7. ප්‍රලේඛන නිලධාරී තනතුර (MA 5-2) - (තනතුරු 01)

**රැකියා විස්තරය :**

ලේඛන/ සටහන් / වාර්තා සකස් කිරීම අධීක්ෂණය කිරීම, අවශ්‍ය තොරතුරු රැස්කිරීම/ බෙදාගැනීම සඳහා අනෙකුත් අංශ සහ ආශ්‍රිත ආයතන සමග සම්බන්ධීකරණය කිරීම, අවශ්‍ය වාර්තා ඉදිරිපත් කිරීම, විධිමත් ප්‍රලේඛන/ තොරතුරු සැකසුම් පද්ධතියක් පවත්වාගෙන යාම, ලිපි සහ ප්‍රකාශන සැකසීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම, වාර්තා ප්‍රකාශයට පත්කිරීම සම්බන්ධ මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය සම්බන්ධ කාර්යය මණ්ඩල සම්බන්ධීකරණය කිරීම සහ අධ්‍යක්ෂවරයා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරී ඉටුකිරීම.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජනසන්නිවේදනය ජනමාධ්‍ය හෝ තොරතුරු තාක්ෂණය/ තොරතුරු පද්ධති පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**අතිරේක සුදුසුකම් :**

අදාළ ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබාතිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**වැටුප් පරිමාණය :** MA5-2 : 2025 රු. (62,310 - 10X1,360-15 X1,670 -5X2,040 - 111,160) (2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**වැටුප :** රු. 51,488/= (කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ (DMS) චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව 2025.01.01 දිනට මූලික වැටුප)

**වයස :** වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

### 8. වෙළඳ පොළ පර්යේෂණ විශ්ලේෂක තනතුර (MA 5-2) - (තනතුරු 01)

**රැකියා විස්තරය :**

පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය සහය ලබාදීම, වෙළඳ පොළ ව්‍යුහය හඳුනා ගැනීමට සහය වීම, තරගකාරී විරෝධී පිළිවෙත් පිළිබඳ විමර්ශන සිදුකිරීම, තොරතුරු /මාධ්‍ය වාර්තා පදනම්ව කර්මාන්ත පිළිබඳ අධ්‍යයනයන් සිදුකිරීම, තරගකාරීත්වය පිළිබඳ වාර්තා සකස් කිරීමට සහය වීම, හඳුනාගත් ප්‍රදේශවල වැටලීම් සිදුකිරීමට සහය වීම සහ සම්බන්ධීකරණය කිරීම, දැනුවත් කිරීමේ සහ උපදේශන වැඩසහන් සඳහා මෙවලම් කට්ටල සැලසුම් කිරීමට දයක වීම, අධක්ෂවරයා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරී ඉටුකිරීම.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආර්ථික විද්‍යාව හෝ අලෙවිකණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**අතිරේක සුදුසුකම් :**

අදාළ ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**වැටුප් පරිමාණය :** MA5-2 : 2025 රු. (62,310 - 10X1,360-15 X1,670 -5X2,040 - 111,160) (2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**වැටුප :** රු. 51,488/= (කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ (DMS) චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව 2025.08.01 දිනට මූලික වැටුප)

**වයස :** වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

### 9. කළමනාකරණ සහකාර තනතුර (MA 1-2) - (තනතුරු 10)

**රැකියා විස්තරය :**

අධිකාරියේ සන්නිවේදන ජාලය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, අමුත්තන් සහ අනෙකුත් අදාළ පාර්ශ්වයන් සමග යහපත් මහජන සම්බන්ධතා පවත්වා ගැනීම, පරිශ්‍රය තුළ අදාළ අංශ/ ඒකක වෙත අමුත්තන් යොමු කිරීම, ලේඛන වචන සැකසීම/ ටයිප් කිරීම, දත්ත සංචිතය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම, අංශ ප්‍රධානියාගේ සහ ආසන්න අධීක්ෂණ නිලධාරියාගේ මග පෙන්වීම යටතේ ලිපි හුවමාරු කටයුතු සඳහා යොමු වීම, වවුචර්, ප්‍රවාහන වියදම් හිමිකම් ලේඛන ආදිය වැනි ගිණුම් ලේඛන සකස් කිරීම, මුදල් පොත සහ සුළු මුදල් පොත ලිවීම, වැටුප් සකස් කිරීමට සහය වීම, මාසික සහ අර්ධ වාර්ෂික ප්‍රකාශන ඇතුලුව EPF සහ ETF වාර්තා පවත්වාගෙන යාම, මූල්‍ය ප්‍රකාශන සහ වාර්තා සකස් කිරීමට සහය දීම, පිරිවැය විශ්ලේෂණ සකස් කිරීමට සහය වීම. ගොනු අවස්ථා ලේඛන සහ වාර්තා නඩත්තු කිරීම, මිල විමසීම් සිදුකිරීමට සහය වීම, විමර්ශන කටයුතු සකස් කිරීම, ලිපි රැස්වීම් වාර්තා/ සටහන් වාර්තා සකස් කිරීම සහ කියවන විට ලිවීම් සිදු කිරීම වැනි ලේකම් කාර්යයන් සඳහා යොමු වීම, දත්ත වගුගත කිරීම සහ වාර්තා සෑදීම, ගබඩා නඩත්තු කිරීමට සහය වීම, GRN සහ නිකුත් කිරීමේ උපදෙස් ලේඛන සකස් කිරීම, තොග ලබාගැනීම, ගබඩා කිරීම සහ නිකුත් කිරීම, තොග වාර්තා/ බින් කාඩ්පත්/ ගබඩා ලේජර් වැනි වාර්තා නඩත්තු කිරීමට සහය වීම, තොග නිසි ලෙස නඩත්තු කිරීමට සහය වීම, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ තොරතුරු පද්ධති කළමනාකරණයට සහය වීම, මෘදුකාංග පැකේජ්/ විසඳුම් ස්ථාපනයට සහය වීම, දෘඩාංග සහ මෘදුකාංග නඩත්තු කිරීම, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ජාලය (Network) නඩත්තු කිරීම, තොරතුර පද්ධති සඳහා ප්‍රධාන සර්වරය පාලනය කිරීම, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ තොරතුර පද්ධති යාවත්කාලීන කිරීම සඳහා සහය වීම IT උපකරණ සහ IT විසඳුම් මිලදී ගැනීම සඳහා පත් කරන ලද තාක්ෂණික කමිටුවට සහය වීම, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ තොරතුරු පද්ධති බිඳ වැටීම් වාර්තා කිරීම, IT උපකරණ සඳහා භාවිත කෙරෙන පරිභෝජ්‍ය ද්‍රව්‍යයන් හි තොග වාර්තා යාවත්කාලීන කිරීමට සහය වීම, අදාළ අධ්‍යක්ෂවරයා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරී ඉටුකිරීම.

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන් :**

(අ) පහත සඳහන් විෂයන් ඇතුලුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස (සා/පෙළ) විභාගය විෂයන් හයකින් සමත් වී තිබීම.

- i. සිංහල/ දෙමළ
- ii. ඉංග්‍රීසි භාෂාව
- iii. ගණිතය

(ආ) අ.පො.ස. (උ/පෙ) විභාගය විෂයන් තුනක් (පොදු පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය හැර) සමත් වී තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සඳහන් සුදුසුකම් සහිත ප්‍රාථමික මට්ටම - පුහුණු සහ ප්‍රාථමික මට්ටම - නුපුහුණු සේවා ගණයන්ට අයත් සේවකයින් අයදුම් කිරීම සඳහා සුදුසු වේ.

**අධ්‍යාපන :**

පහත සඳහන් විෂයන් ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස (සා/පෙ) විභාගය විෂයයන් හයකින් සමත් වී තිබීම.

- i. සිංහල/ දෙමළ
- ii. ඉංග්‍රීසි භාෂාව
- iii. ගණිතය

**වෙනත් :**

ඉහත සේවා ඝණ යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සටහන :**

ස්ථිර තනතුරකට පත් කිරීමට පෙර ඕනෑම සේවා කාලයක් හෝ පූර්ව අවශ්‍යතාවයක් ලෙස පුහුණුව යටතේ සම්පූර්ණ කළයුතු සේවා කාලයක් ඉහත සඳහන් පරිදි සුදුසුකම් සඳහා අවශ්‍ය සේවා කාලය වන වසර පහ සඳහා ඇතුළත් කර ගණන් නොගත යුතුය. අනියම්/ තාවකාලික පදනම මත කරන ඕනෑම සේවා කාලයක් ද මේ සඳහා ගණන් නොගත යුතුය.

**වැටුප් පරිමාණය :**

MA 1-2 :2025 රු. (46,220 - 10X540 -7X630, 12X1080, - 12X1280 - 84,350) (2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**වැටුප :** රු. 40,403/= (කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ (DMS) චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව 2025.01.01 දිනට මූලික වැටුප)

**වයස :** වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

### 10. කළමනාකරණ සහකාර (සරප්) තනතුර (MA 1-2) - (තනතුරු 01)

**රැකියා විස්තරය :**

මුදල් ලබාගැනීම, ලදුපත් නිකුත් කිරීම, චෙක්පත් භාරගැනීම සහ ලදුපත් නිකුත් කිරීම, දිනපතා එකතු වන මුදල් සහ චෙක්පත් බැංකුගත කිරීම, ප්‍රවාහනයේ ඇති මුදල් හැසිරවීම, සුළු මුදල් අත්මුදල් සහ වෙනත් සහ අත්මුදල් භාරකරු ලෙස ක්‍රියා කිරීම, නිසි වාර්තා සහ ලේඛන පවත්වාගෙන යාම, මුදල් සහ චෙක්පත් ආරක්ෂිතව මෙහෙයවීම, අධ්‍යක්ෂවරයා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරී

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

(අ) පහත සඳහන් විෂයන් ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස (සා/පෙළ) විභාගය විෂයන් හයක් සමත් වී තිබීම.

- i. සිංහල/ දෙමළ
- ii. ඉංග්‍රීසි භාෂාව
- iii. ගණිතය

(ආ) අ.පො.ස. (උ/පෙ) විභාගය වාණිජ්‍ය විෂය ධාරාවෙන් විෂයන් තුනක් (පොදු පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය හැර) සමත් වී තිබීම.

(ඇ) AAT/CMA/ICASL/CIMA ලියාපදිංචි ශිෂ්‍යයෙක් වීම හෝ පිළිගත් ගණකාධිකරණ ආයතනයකින් ලබාගත් වෙනත් ඕනෑම අදාළ සුදුසුකමක් අතිරේක සුදුසුකමක් වේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික මට්ටම - පුහුණු සහ ප්‍රාථමික මට්ටම නුපුහුණු සේවා ඝණයට අයත් සේවකයින් මේ සඳහා අයදුම් කිරීමට සුදුසු වේ.

**අධ්‍යාපන :**

පහත සඳහන් විෂයන් ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථක සහිතව අ.පො.ස (සා/පෙ) විභාගය විෂයයන් හයකින් සමත් වී තිබීම.

- i. සිංහල/ දෙමළ
- ii. ඉංග්‍රීසි භාෂාව
- iii. ගණිතය

**වෙනත් :**

ඉහත සේවා ඝණ යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සටහන :**

ස්ථිර තනතුරකට පත් කිරීමට පෙර ඕනෑම සේවා කාලයක් හෝ පූර්ව අවශ්‍යතාවයක් ලෙස පුහුණුව යටතේ සම්පූර්ණ කළයුතු සේවා කාලයක් ඉහත සඳහන් පරිදි සුදුසුකම් සඳහා අවශ්‍ය

සේවා කාලය වන වසර පහ සඳහා ඇතුළත් කර ගණන් නොගත යුතුය. අනියම්/ තාවකාලික පදනම මත කරන ඕනෑම සේවා කාලයක් ද මේ සඳහා ගණන් නොගත යුතුය.

**වැටුප් පරිමාණය :**

MA 1-2 :2025 රු. (46,220 - 10X540 -7X630 - 12X1080 - 12X1280 - 84,350) (2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**වැටුප :** රු. 40,403/= (කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ (DMS) චක්‍රලේඛ අංක 01/ 2025 ප්‍රකාරව – 2025.01.01 දිනට මූලික වැටුප)

**වයස :** වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**පොදු කොන්දේසි**

**පත්කිරීමේ ස්වභාවය :**

ස්ථිර තනතුරක් වන අතර අදාළ රාජ්‍ය චක්‍රලේඛයන්හි විධිවිධානයන්ට යටත්ව සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලට හිමිකම් යටතේ ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ලබයි.

**බඳවා ගැනීමේදී වැටුප :**

බාහිර වශයෙන් බඳවා ගන්නා ලද පුද්ගලයින් වැටුප් පරිමාණයෙහි ආරම්භක පියවරෙහි තබනු ලැබේ. අභ්‍යන්තරව බඳවා ගනු ලබන පුද්ගලයන්ගේ වැටුප ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව තීරණය කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

තනතුරෙහි රාජකාරීන් මනා ලෙස ඉටුකිරීමටත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් මනා කායික හා මානසික යෝග්‍යතාවයක් තිබිය යුතුය. විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.

යෝග්‍යතාපූර්ණ අයදුම්කරුවන්ට මෙම දැන්වීම පළවූ දින සිට දින 14 ක් ඇතුළත තම අයදුම්පත් පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන මෙන් දන්වා සිටිනු ලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික පිටපත් අයදුම්පත සමග ඇමිණිය යුතුය. රාජ්‍ය අංශයේ සේවය කරනු ලබන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අවසන් දින පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ. ඉල්ලුම් කරනු ලබන තනතුර ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි සඳහන් කළ යුතුය. කරුණාකර ඔබගේ අයදුම්පත පහත ලිපිනයට යොමු කරන්න.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,**
**1 වන සහ 2 වන මහල,**
**සතොස මහ ලේකම් කාර්යාලය,**
**අංක 27. වොක්ෂෝල් වීදිය,**
**කොළඹ 02.**

## ඇබෑර්තු - කොන්ත්‍රාත් පදනම මත

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පවතින පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 01. සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආයතනික සංනිවේදන) තනතුර - කොන්ත්‍රාත් පදනම MM 1-1 (තනතුරු 01)

**රැකියා විස්තරය :**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි (CAA) ආයතනික සංනිවේදන ඒකකයේ ප්‍රධානියා වේ, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි (CAA) මහජන දැනුවත් කිරීම්, ප්‍රකාශන සහ සන්නිවේදන පිළිබඳ දත්ත සහ තොරතුරු නඩත්තු කිරීම, මාධ්‍යකරුවන් සහ මාධ්‍ය ආයතන සමග සම්බන්ධ වීම, මාධ්‍ය සඳහා ප්‍රවෘත්ති සහ තොරතුරු නිකුත් කිරීමේ වගකීම, මාධ්‍ය වාර්තා ඉදිරිපත් කිරීම, මහජන දැනුවත් කිරීම් සහ වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු රැස්කිරීම සඳහා අභ්‍යන්තර අංශ සමග සම්බන්ධීකරණය කිරීම, දේශීය හා ජාත්‍යන්තර පාරිභෝගිකයන් ආශ්‍රිත සංවිධාන සමග සම්බන්ධ වීම සහ වාර්තා යාවත්කාලීන කිරීම, අභ්‍යන්තර පාර්ශ්වයන් සමග සන්නිවේදනය සංවර්ධනය කිරීම, අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක්.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජන සන්නිවේදනය හෝ මාධ්‍යවේදය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**සමග**

සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද .

**සේවක සණයේ වැටුප් කේතය**

MM 1-1 වැටුප් පරිමාණයේ මූලික පියවරට සමාන මාසික දීමනාව සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව ඉහත කී වැටුප් පරිමාණයට අදාළ දීමනා හිමි වේ. කෙසේ වුවද, කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරන්නේ නම්, ඔහුගේ/ ඇයගේ, කාර්ය සාධනය සලකා බැලීම මත MM 1-1 වැටුප් පරිමාණයට සම්බන්ධ එක් වැටුප් වර්ධකයක් සඳහා සේවකයා හිමිකම් ලබයි.

**වැටුප :** රු. 71,730/=

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි ඇමුණුම II හි සඳහන් උපදෙස් පරිදි වැටුප් ගෙවනු ලැබේ. කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීම වාර්ෂිකව සලකා බැලිය හැක.

**වයස :** වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

### 02. මාධ්‍ය නිලධාරී තනතුර - කොන්ත්‍රාත් පදනම (MA 5-2)- (තනතුරු 01)

**රැකියා විස්තරය :**

මහජනයා දැනුවත් කිරීමේ වාර්තා ලිවීමේ වාර්තා පළ කිරීම ප්‍රවෘත්ති නිකුත් කිරීම සහ මාධ්‍ය වෙත තොරතුරු ලබාදීම සඳහා මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය කාර්යය මණ්ඩල සමග සම්බන්ධීකරණය, මහජන දැනුවත් භාවය සහ වෙන් ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත සහ තොරතුරු රැස්කිරීම, අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්ව සමග සන්නිවේදනය පවත්වා ගැනීම, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ (CAA) ප්‍රකාශන පිළිබඳ දත්ත බැංකුව සහ වාර්තා පවත්වාගෙන යාම අවස්ථා වාර්තාගත කිරීම සඳහා කැමරාකරු මෙහෙයැවීම, සහකාර අධ්‍යක්ෂ (ආයතනික සංනිවේදන) විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක්.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජනසන්නිවේදනය, මාධ්‍යවේදය පිළිබඳ ප්‍රථම උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබීම.

**සේවක සණයේ වැටුප් කේතය :**

MA 5-2 වැටුප් පරිමාණයේ මූලික පියවරට සමාන මාසික දීමනාව සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව ඉහත කී වැටුප් පරිමාණයට අදාළ දීමනා හිමි වේ. කෙසේ වුවද කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරන්නේ නම් ඔහුගේ/ ඇයගේ කාර්ය සාධනය සලකා බැලීම මත MA5 -2 වැටුප් පරිමාණයට සම්බන්ධ එක් වැටුප් වර්ධකයක් සඳහා සේවකයා හිමිකම් ලබයි.

**වැටුප :** රු. 51,488/=

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි ඇමුණුම II හි සඳහන් උපදෙස් පරිදි වැටුප් ගෙවනු ලැබේ. කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීම වාර්ෂිකව සලකා බැලිය හැක.

**වයස :** වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**පොදු කොන්දේසි :**

**පත්කිරීමේ ස්වභාවය : කොන්ත්‍රාත් පදනම මත**

මෙම තනතුර සඳහා බඳවා ගැනීම වර්ෂයක කොන්ත්‍රාත් කාලයකට යටත් වන අතර ස්ථිර පත්වීමක් ලබාගැනීමට හිමිකම් නොමැත.

මෙම පත්වීම, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කිසිදු ස්ථිර රැකියාවක් සඳහා කිසිදු හිමිකම් පෑමක් සිදු නොකරයි.

ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

තනතුරෙහි රාජකාරීන් මනා ලෙස ඉටුකිරීමටත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් කායික හා මානසික යෝග්‍යතාවයක් තිබිය යුතුය.

විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.

යෝග්‍යතාපූර්ණ අයදුම්කරුවන්ට, මෙම දැන්වීම පළවූ දින සිට දින 14 ක් ඇතුළත තම අයදුම්පත් පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන මෙන් දන්වා සිටිනු ලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික පිටපත් ද අයදුම්පත සමග ඇමිණිය යුතුය. රාජ්‍ය අංශයේ සේවය කරනු ලබන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අවසන් දින පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. බලපෑම් කිරීම නුසුදුසුකමක් සේ සලකනු ලැබේ. ඉල්ලුම් කරනු ලබන තනතුර ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි සඳහන් කළ යුතුය. කරුණාකර ඔබගේ අයදුම්පත් පහත ලිපිනයට යොමු කරන්න.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,**
**1 වන සහ 2 වන මහල,**
**සතොස මහ ලේකම් කාර්යාලය,**
**අංක 27, වොක්ෂෝල් වීදිය,**
**කොළඹ 02.**